# 24. ජුදෙව් පාස්කුව

ශලෝම් !

ප්‍රිය ලක්ෂ්මී,

මා ඔබට මේ ලිපිය ලියන්නේ ඉතා ප්‍රීතිමත් කාලයකයි. නිසාන් මාසයේ 14 වන දින සිට අපි පාස්කු උත්සවය පවත්වනවා.

දෙවියන් වහන්සේ අප වෙනුවෙන් කළ ඉතා බලවත් දෙයක් අපි පාස්කුවේ දී සිහිපත් කරනවා. අපේ ජුදෙව් ජනතාව එක් කලෙක ඊජිප්තුවේ වහල් සෙනඟක් ලෙස ජීවත් වුණා. දෙවියන් වහන්සේ ඔවුන් ඒ දුක් සහිත ජීවිතයෙන් මුදාගෙන තම රටට ආපසු ඒමට සැලැස්සුවා. ඊජිප්තුවේ රජතුමා ඔවුන්ට ඒ රටෙන් පිට වී යාමට අවසර දෙන්න කැමති වූයේ නැහැ. අප සෙනඟගේ නායකයා ලෙස දෙවියෙන් වහන්සේ පත් කළේ මෝසෙස් ය.

ඔහු රජතුමා වෙත ගොස් අප යුදෙව් සෙනඟට නිදහසේ රටෙන් පිට වී යැමට අවසර ඉල්ලුවා. අවසර ලබා ගැනීමට ඉතා ම අමාරු වුණා. අන්තිමේ දී අවසර ලැබුණේ එක් දිනක රාත්‍රී කාලයේ දී ය. ඒ නිසා තමයි අපි පාස්කු උත්සවය රාත්‍රී කාලයේ පවත් වන්නේ.

එදා හදිසියේ පිට වී යාමට සිදු වූ නිසා මුහුන් දමා රොටි සෑදීමට වේලාව තිබුණේ නැහැ. ඒ නිසයි, අපි මේ උත්සවයට මුහුන් නැති රොටි කන්නේ. තිත්ත පලා, බැටළු මස්, පලතුරු වර්ග, මිදි යුෂ මේ ආහාර වේලට යොදා ගන්නවා.

''හලෙලූයියා'' සමිඳුන් පසසන්න යන ප්‍රශංසා ගී නිතර මේ කාලයේ ගායනා කරනවා. ඔබට දේව පිහිටයි !

මෙයට
හිතවත්
එලියේසර්

## පැවරුම්

පහත සඳහන් කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ජුදෙව් පාස්කුව පැවැත්වෙන මාසය හා දිනය නම් කරන්න.

2. ජුදෙව්වරු පාස්කු උත්සවය මගින් සමරන්නේ කුමක් ද?

3. පාස්කු උත්සවය රාත්‍රී කාලයේ පැවැත් වීමට හේතුව දක්වන්න.

4. ජුදෙව්වරු ඊජිප්තුවේ ගත කළ වහල් ජීවිතයෙන් මුදා ගැනීම සඳහා දෙවියන් වහන්සේ තෝරා ගත් නායකයා නම් කරන්න.

5. ''හලෙලූයියා'' යන වචනයෙහි තේරුම ලියන්න.